# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1070/13 - 1999 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්ද - 1999.03.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

#### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. මෙම ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය 1995.01.01 දින සිට ක්‍රියාත්මක වූයේ යයි සැළකිය යුතුය.

02. ගුරු විද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතේ හෝ අධ්‍යාපන විද්‍යාපීඨවල අදාළ අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන් යටතේ ගන්නා ලද හෝ ගනු ලැබුවේ යයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

03. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්, 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනතේ විධිවිධානයන් අභිබවා හෝ උල්ලංඝනය වන පරිදි හෝ ක්‍රියාත්මක නොවිය යුතුය.

04. අර්ථ නිරූපනය :-

(අ) "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

(ආ) "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයයි.

(ඇ) "කමිටුව" යන පදයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව අදහස්වේ.

(ඈ) "අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන පදයෙන් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස්වේ.

(ඉ) "නියමිත දිනය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 1995.01.01 දිනය.

(ඊ) "ජාතික අධ්‍යාපන ආයතනය" යන පදයෙන් 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය අදහස්වේ.

(උ) "ජාතික ගුරු අධ්‍යාපන අධිකාරය" යන පදයෙන් 1997 අංක 32 දරන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද "ජාතික ගුරු අධ්‍යාපන අධිකාරය" අදහස් වේ.

(ඌ) "අධ්‍යාපන විද්‍යා පීඨයක්" යන පදයෙන් 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යාපීඨ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පූර්ව සේවා ගුරු පුහුණු ආයතනයක් අදහස්වේ.

(එ) "අධ්‍යාපන විද්‍යා පීඨ මණ්ඩලය" යන පදයෙන් 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යාපීඨ පනතේ අර්ථ නිරූපනය

කරන ලද අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලය අදහස්වේ.

(ඒ) "ගුරු විද්‍යාල" යන පදයෙන් ගුරු පුහුණුව සඳහා පිහිටුවන ලද ගුරු විද්‍යාල අදහස්වේ.

(ඔ) "ගුරු අධ්‍යාපන ආයතන" යන පදයෙන් ගුරුවරුන් සඳහා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ද ක්‍රියා කළ හැකි කෙටි කාලීන අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා පිහිටුවන ලද ආයතනයක් අදහස් වේ.

(ඕ) "ගුරු මධ්‍යස්ථාන" යන පදයෙන් ගුරු අධ්‍යාපන ආයතනවලට සමාන කාර්යයක් ඉටු කෙරෙන නේවාසික නොවන ආයතනයක් අදහස්වේ.

(ක) "අදාළ විෂය ක්ෂෙත්‍රය" යන පදයෙන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ "ආ" උපලේඛනයේ නිශ්චිතව සඳහන් විෂය ක්ෂෙත්‍රයන්ගෙන් ඕනෑම එකක් අදහස් වේ.

(ග) "සතුටුදායක සේවය" යන පදයෙන් රජයේ ආයතන සංග්‍රහයේ අර්ථ නිරූපනය කරන ලද සතුටුදායක සේවය අදහස් වේ.

(ජ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්/පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් යනුවෙන් සඳහන් වන අවස්ථාවලදී, එයට පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්/පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සමාන තත්ත්වයෙහිලා පිළිගනු ලබන, වෙනත් සුදුසුකම් ද ඇතුළත්වේ.

05. ව්‍යුහය, සේවක සංඛ්‍යාව හා වැටුප් පරිමාණයන් :

(I) *1997.01.01* දින සිට ක්‍රියාත්මක වන ව්‍යුහය, සේවක සංඛ්‍යාව හා වැටුප් පරිමාණයන් :

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය පහත දැක්වෙන ඕනෑම පංතියකට අන්තර්ග්‍රහණය කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ නිලධාරීන් හෝ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

1 පන්තිය

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව | – | 17 |
| වැටුප් පරිමාණය | – | වාර්ෂිකව රු. 1,79,520–10×8,160–රු. 2,61,120 |

2 පන්තිය I වැනි ශ්‍රේණිය

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව | – | 48 |
| වැටුප් පරිමාණය | – | වාර්ෂිකව රු. 1,55,100–7×5,520–රු. 1,93,740 |

2 පන්තිය II ශ්‍රේණිය

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව | – | 316 |
| වැටුප් පරිමාණය | – | වාර්ෂිකව රු. 1,38,540–7×5,520–රු. 1,77,180 |

3 පන්තිය

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව | – | 742 |
| වැටුප් පරිමාණය | – | වාර්ෂිකව රු. 97,500–15×2,700–රු. 1,38,000 |
| | – | පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම රු. 1,16,400 ට පෙර |
| | – | දෙවන කාර්යක්ෂමතා කඩඉම රු. 1,24,500 ට පෙර |

සංලක්ෂය : (අ) සේවයට ඇතුළත් වීමට මූලික සුදුසුකම් ඇති තැනැත්තන් 3 පන්තියට පත්කිරීමේදී හා අන්තර්ග්‍රහණය කිරීමේදී සේවා කාලය හා සුදුසුකම් පාදක කොට ගෙන වාර්ෂිකව රු. 1,08,300 වැටුප් පියවර මත තබනු ලැබේ.

ගුරු අධ්‍යාපනඥ සේවයට ඇතුළත් කිරීම සඳහා ... 

(ආ) 1995.01.01 දින සිට 1997.12.31 දින දක්වා වූ හිඟ වැටුප් කිසිවක් ගෙවනු නොලැබෙන අතර, ගුරු අධ්‍යාපනඥ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන්නන්ට මෙකී කාල පරිච්ඡේදය තුළදී වේතනාධික වාසිවලට පමණක් හිමිකම් ලැබෙනු ඇත.

(ඇ) සේවයේ අවශ්‍යතා අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව වරින් වර සේවක සංඛ්‍යාව සංශෝධනය කළ හැකිය.

(II) 1995.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වූයේ යයි සැලකිය යුතු වැටුප් පරිමාණයන් :

1 පන්තිය

වැටුප් පරිමාණය – වාර්ෂිකව රු. 1,05,000–10×4,800–රු. 1,53,000

2 පන්තිය I වැනි ශ්‍රේණිය

වැටුප් පරිමාණය – වාර්ෂිකව රු. 83,400–4×3,000–රු. 95,400

2 පන්තිය II ශ්‍රේණිය

වැටුප් පරිමාණය – වාර්ෂිකව රු. 80,400–7×3,000–රු. 1,01,400

3 පන්තිය

වැටුප් පරිමාණය – වාර්ෂිකව රු. 53,880–15×1,560–රු. 77,280

06. සේවයට පත් කරනු ලබන සෑම පුද්ගලයෙක්ම/නිලධාරියෙකුම සිය තනතුරෙහි ස්ථිර කිරීමට පෙර රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව පරිවාස/වැඩ බැලීමේ කාලසීමාවක් සේවය කිරීමට යටත් වනු ඇත.

07. සේවයේ සාමාජිකයන්ට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ "අ" උපලේඛනයේ දක්වා ඇති තනතුරු දැරිය හැකි අතර දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට නියම කළ හැකිය.

08. ඕනෑම වසරක් තුළ අදාළ විෂය ක්ෂේත්‍රයක ඕනෑම පංතියක පුරප්පාඩු සංඛ්‍යාව ජනවාරි 01 දිනට සහ ජූලි 01 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

09. සේවයේ නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම හා විනය පාලනය පිළිබඳ බලතල කමිටුව මගින් ක්‍රියාත්මක කළ යුතුය.

10. සේවයේ කළමනාකරණය හා සේවයේ සාමාජිකයින්ගේ වෘත්තිය සංවර්ධනය ඇති කරලීම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීම විය යුතුය.

11. පළාත් රාජ්‍ය සේවය සඳහා නිලධාරීන් මුදා හැරීම :

(i) සේවයේ නිලධාරියකු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා කමිටුවේ එකඟත්වය ඇතිව, සේවයේ අවශ්‍යතාවයන්ට යටත්ව, පළාත් රාජ්‍ය සේවයේ සේවය කළ යුතුය. එවැනි කාලසීමාවක් අවසානයේ දී නිලධාරියා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාවට අනුවර්ථනය වනු ඇත.

(ii) සේවයේ නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයට මුදාහැර ඇති කාලසීමාව තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට හා විනය පාලනයට යටත් විය යුතුය. කෙසේ වුවද එවැනි නිලධාරියකුට කමිටුව වෙත අභියාචනයක් කිරීමේ හිමිකම ඇත.

12. සේවයේ 3 වන පංතියට බඳවා ගැනීම :

සේවයේ 3 වන පංතියට පත්කිරීම් සඳහා තෝරා ගැනීම කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත විය යුතුය.

යම් පුද්ගලයකු මෙහි පහත "අ" යටතේ දැක්වෙන සියලුම සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇත්නම් සේවයේ 3 වන පංතියට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(අ) ඉල්ලුම් කිරීමට සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

(ii) විශිෂ්ට චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු මනා ශරීර ශක්තියක් ඇති අයෙකු වීම.

(iii) අයදුම්පත් භාර ගන්නා මාසයේ පළමු දිනයේ දී අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමුවන හෝ දෙවන (ඉහළ) පංතියේ උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම හෝ,

(v) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ,

(vi) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පළමුවන හෝ දෙවන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය පිළිබඳ උපාධියක් සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර තනතුරක් දරන, වසර තුනකට නොඅඩු ඉගැන්වීම පිළිබඳ සතුටුදායක සේවා පළපුරුද්දක් ඇති වයස අවුරුදු 40 නොඉක්මවූ අයකු විම.

I වන ව්‍යතිරේකය :- පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නියමිත දිනයේ සිට පස් අවුරුද්දක් ගත වනතුරු එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පහත දැක්වෙන සුදුසුකම් අවම සුදුසුකම් ලෙස භාරගනු ලබන අතර, පස් අවුරුදු කාලසීමාව අවසානයේ දී මෙම තත්ත්වය සමාලෝචනය කරනු ලැබේ.

(i) ඉංග්‍රීසි :

(අ) ඉංග්‍රීසි ගුරු පුහුණු සහතිකය සහ පුහුණුවෙන් පසුව වසර 10 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි විෂයයක් සහිතව ලබාගත් උපාධියක් හෝ ඉංග්‍රීසි විශේෂ උපාධියක් සහිතව අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිතව, 2 වන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

(ii) ශාරීරික අධ්‍යාපනය :
ශාරීරික අධ්‍යාපනය පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග වසර 07 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද හෝ අධ්‍යාපන අමාත්‍යාංශයට පිළිගත හැකි ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ විශේෂඥ පුහුණු ගුරු සහතිකය හා පුහුණුවෙන් පසුව වසර 10 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද.

(iii) තාක්ෂණික විෂයයන් :

1. ඉදිකිරීම් තාක්ෂණය.
2. යාන්ත්‍රික තාක්ෂණය.
3. කලා හා ශිල්ප.
4. විදුලිය හා විද්‍යුත් තාක්ෂණය.
5. ගෘහ ආර්ථික විද්‍යාව.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව ලබාගත් උපාධියක් හා 07 වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද හෝ පුහුණුවෙන් පසු 10 වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද සමග ගුරු පුහුණු සහතිකය හා අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ පහත දැක්වෙන ඕනෑම සහතිකයක්.

(i) තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික සහතිකය.

(ii) තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය.

(iii) රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ බහුතාක්ෂණික ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු කාලයක් සඳහා වූ ඩිප්ලෝමා සහතිකය.

(iv) "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" I හෝ II හෝ III සහතිකය.

(v) අමාත්‍යාංශයේ ලේකම්වරයාට පිළිගත හැකි පිළිගත් තාක්ෂණික ආයතනයකින් ලබා ගත් වෙනත් තාක්ෂණික සහතිකයක්.

**II** වන ව්‍යතිරේකය :– යම් පුද්ගලයකු තමා බඳවා ගන්නා විට පදනම් කරගත් උපාධිය / ඩිප්ලෝමාව / සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නොවේ නම් පත්වීම් දින සිට තෙවසරක් ඇතුළත ඉංග්‍රීසි භාෂාව / සාහිත්‍ය සඳහා අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථ මට්ටමේ දැනීමක් ලබා ගතයුතු වීම.

**III** වන ව්‍යතිරේකය :– සේවයට බඳවා ගන්නා නවකයින් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළියෙල කරනු ලබන නියමිත ආයතනයකදී නව මසක කාලසීමාවකට නොඅඩු බඳවා ගැනීමේදී දෙනු ලබන අනිවාර්ය දිගාභිමුඛ පුහුණුවට භාජනය විය යුතුය. මෙම පුහුණුව සතුටුදායක අන්දමින් නිම කිරීමට අපොහොසත් වන අයවලුන් ඔවුන් විසින් රාජ්‍ය සේවයේ කලින් දැරූ තනතුරුවලට ආපසු යැවීමට හෝ සේවය අවසන් කිරීමට හෝ සිදුවිය හැකිය.

**13. 2 වන පන්තියේ II ශ්‍රේණියට පත්කිරීම / උසස් කිරීම** :– පුරප්පාඩු වලින් 25% කට නොවැඩි සංඛ්‍යාවක් කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත පත් කරනු ලැබේ. පහත සඳහන් සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරාලන නිලධාරින්ගෙන් / තැනැත්තන්ගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) යටත් පිරිසෙයින් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සහිත අදාළ විෂය ක්‍ෂෙත්‍රය පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිධරයෙක් වීම.

(ii) අමාත්‍යාංශයේ ලේකම්වරයාට පිළිගත හැකි ශ්‍රී ලංකාවේ හෝ පිටරටක පාසලක / විශ්වවිද්‍යාලයක, ගුරු අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ගුරුවරයෙක් ලෙස වසර 8 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) වයස අවුරුදු 45 ට නොවැඩි වීම.

**14.** 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ ඉතිරි පුරප්පාඩු (75%) පහත සඳහන් සුදුසුකම් තෘප්ත කරන සේවයේ 3 වන පන්තියේ වසර 7 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරාලන අපේක්‍ෂකයින් අතුරෙන් කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

(අ) පහත සඳහන් සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා තෘප්ත කර තිබීම.

(i) 3 වන පන්තිය යටතේ උපලේඛනගත තනතුරක වසර 7 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම; සහ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ 1 වැනි පන්තියේ හෝ 2 වැනි පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳව ඉහළ උපාධියක් ලබා තිබීම ;හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්‍ෂෙත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ට හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්‍ෂෙත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ,

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් 1 වැනි පංතිය හෝ 2 වන පංතියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්‍ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සටහන :– අධ්‍යාපන විද්‍යාපීඨයක සහකාර කථිකාචාර්ය තනතුරක සේවා කාලය 3 වැනි පන්තිය යටතේ වූ සේවා කාලයක් වශයෙන් ගණන් ගනු ලැබේ.

(ආ) තෝරා ගැනීම :– කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් කෙරෙන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

**15. සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට පත් කිරීම් / උසස් කිරීම** :– 1. සේවයේ 2 වැනි පන්තියේ II ශ්‍රේණිය යටතේ උපලේඛනගත තනතුරක පස් වසරකට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවයේ ස්ථිර කරනු ලැබූ පහත දක්වන සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

(i) අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක්.සහිතව පහත සඳහන් ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ 1 වැනි හෝ 2 වැනි පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම ; හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදළ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදළ විෂය ක්ෂෙත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම ; හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් 1 වන පන්තියේ හෝ 2 වන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදළ විෂය ක්ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සංලක්ෂය : නියමිත දිනට අධ්‍යාපන විද්‍යාපීඨයක ස්ථිර කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ සහාය කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ වසර පහකට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වයස 45 ඉක්මවා සිටින අය ඉහත (1) වැනි උප ඡේදයෙහි ඇතුළත් අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් තිබීමේ අවශ්‍යතාවයෙන් පමණක් නිදහස් කරනු ලැබේ.

(ii) තෝරා ගැනීම :-

කමිටුව විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

16. සේවයේ 1 වැනි පන්තියට පත් කිරීම/උසස් කිරීම :

(i) සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණිය යටතේ උපලේඛනගත තනතුරක පස් වසරකට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර සේවයේ ස්ථිර කරනු ලැබ ඇති නිලධාරීන්ට පහත දැක්වෙන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා කර තිබේ නම් අයදුම් කළ හැකිය.

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ 1 වැනි පන්තියේ හෝ 2 වැනි පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම ; හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදළ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදළ විෂය ක්ෂෙත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම ; හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් 1 වන හෝ 2 වන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදළ විෂය ක්ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) තෝරා ගැනීම :

තෝරා ගැනීම කරනු ලබන්නේ කමිටුව විසින් පත්කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත තේරීම් මණ්ඩලයක් විසින් වෘත්තීය කාර්ය සාධක ඇගයීම සඳහා සකස් කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. අමාත්‍යාංශයේ ලේකම් මෙම තේරීම් මණ්ඩලයේ සභාපති වන අතර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මට්ටමට නොඅඩු නිලධාරීන් / විශ්ව විද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් ආදී වශයෙන් තවත් නිලධාරීන් /පුද්ගලයින් හතර දෙනෙකුගෙන් සමන්විත වනු ඇත. නිලධාරීන්ගෙන් යටත්පිරිසෙයින් එක් අයෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විය යුතු අතර, තවත් අයෙක් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පිටස්තර අමාත්‍යාංශයකින් විය යුතුය.

17. උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම්, 2000.07.01 සිට බලපැවැත්වෙන පරිදි සේවයේ සෑම පන්තියක් සඳහා පත්කිරීම/උසස් කිරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (සා.පෙළ) හෝ සමාන විභාගයකදී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත.

18. අන්තර්ග්‍රහණය කිරීමේ පරිපාටිය :

(අ) අධ්‍යාපන විද්‍යාපීඨ කාර්ය මණ්ඩලය :

අධ්‍යාපන විද්‍යාපීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවක සංඛ්‍යාවේ තනතුරුවලට ස්ථිරව පත් කරනු ලැබ නියමිත දිනයේ දී එවැනි තනතුරු දරන සියලුම නිලධාරීන් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි පහත දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අන්තර්ග්‍රහණය කරනු ඇත.

(i) අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන් වශයෙන් ස්ථිර පත්වීම් ලැබ නියමිත දිනයේදී එම තනතුරු දරමින් සිටින පීඨාධිපතිවරුන් සේවයේ I වැනි පන්තියට.

(ii) අධ්‍යාපන විද්‍යාපීඨවල උප පීඨාධිපතිවරුන් වශයෙන් ස්ථිර පත්වීම් ලැබ නියමිත දිනයේදී එම පත්වීම් දරමින් සිටින උප පීඨාධිපතිවරුන් සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට.

(iii) අධ්‍යාපන විද්‍යාපීඨවල කථිකාචාර්යවරුන් හා සම්බන්ධීකරණ කථිකාචාර්යවරුන් වශයෙන් ස්ථිර පත්වීම් ලැබ නියමිත දිනට එම තනතුරු දරමින් සිටින කථිකාචාර්යවරුන් හා සම්බන්ධීකරණ කථිකාචාර්යවරුන් සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට.

(iv) අධ්‍යාපන විද්‍යාපීඨවල සහකාර කථිකාචාර්යවරුන් වශයෙන් ස්ථිර පත්වීම් ලැබ, නියමිත දිනට එම තනතුරු දරමින් සිටින සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා නියමිත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති හා සහකාර කථිකාචාර්යවරුන් වශයෙන් අවුරුදු 7කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර කථිකාචාර්යවරුන්, සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට.

(v) ඉංග්‍රීසි, සෞන්දර්යය (සංගීත, නැටුම්, චිත්‍ර) හා ශාරීරික අධ්‍යාපන විෂය ක්ෂෙත්‍ර සඳහා 1985.02.15 දින දරන රජයේ ගැසට් නිවේදනයේ සඳහන් වූ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් මත පත් කරනු ලැබ, නියමිත දිනට එම තනතුරු දරන හා වයස අවුරුදු 45 සම්පූර්ණ කර ඇති හෝ නියමිත දිනට අවුරුදු 9 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධ්‍යාපන විද්‍යාපීඨ සහාය කථිකාචාර්යවරුන් / කථිකාචාර්යවරුන් පමණක් 2 වැනි පංතියේ II වැනි ශ්‍රේණියට.

(vi) අධ්‍යාපන විද්‍යාපීඨ සහාය කථිකාචාර්යවරුන් වශයෙන් ස්ථිර පත්වීම් ලැබ, නියමිත දිනට එම තනතුරු දරමින් සිටින 2 පන්තියේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට ඉහත IV වැනි ඡේදය යටතේ නියමිත සුදුසුකම් සම්පූර්ණ කර නැති සහාය කථිකාචාර්යවරුන් සේවයේ 3 වැනි පන්තියට.

1995.01.01 → 2005.10.24

(ආ) ගුරු විද්‍යාල කාර්ය මණ්ඩලය :

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට (ශ්‍රී.ලං.අ.ප.සේ) ස්ථිර පත්වීම් ලැබ නියමිත දිනයේ දී ගුරු විද්‍යාලයක විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හෝ කථිකාචාර්ය යනාදි ස්ථිර සේවක සංඛ්‍යාවේ තනතුරු දරන සියලුම නිලධාරීන් මෙම ව්‍යවස්ථා සංග්‍රහය රජයේ ගැසට් පත්‍රයේ පළ කල දිනයේ සිට තෙමසක් තුළ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීම සඳහා සිය මනාපය දක්වමින් කමිටුව වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමට යටත්ව, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට පහත දැක්වෙන අයුරින් අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(i) මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ සේවයට ඇතුළත් වීම සඳහා නියමිත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති නියමිත දිනයේ ගුරු විද්‍යාල සේවයේ නියුක්තව සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ නිලධාරීන් සේවයේ I වැනි පන්තියට.

(ii) මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ සේවයට ඇතුළත් වීම සඳහා නියමිත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති නියමිත දිනයේදී ගුරු විද්‍යාල සේවයේ නියුක්තව සිටින ශ්‍රී. ලං.අ.ප. සේවයේ 11 පන්තියේ නිලධාරීන් සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට.

(iii) නියමිත දිනයේදී ශ්‍රී. ලං.අ.ප. සේවයේ අවුරුදු 7 ක නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නියමිත දිනයේදී මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති ශ්‍රී. ලං.අ.ප. සේවයේ 3 පංතියේ, ගුරු විද්‍යාලවල කථිකාචාර්යවරුන් සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට.

(iv) මෙම ව්‍යවස්ථා සංග්‍රහය අනුව සේවයේ 3 වෙනි පංතියට ඇතුළුවීම සඳහා නියමිත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති, නියමිත දිනයේදී අවුරුදු 7 කට අඩු සේවා කාලයක් ඇති ශ්‍රී. ලං.අ.ප. සේවයේ 3 වැනි පන්තියේ ගුරු විද්‍යාලවල කථිකාචාර්යවරුන් සේවයේ 3 වැනි පන්තියට.

(I) වන ව්‍යතිරේකය :– ඉංග්‍රීසි, සෞන්දර්යය (චිත්‍ර, සංගීත හා නැටුම්) හා ශාරීරික අධ්‍යාපනය විෂය ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් වූ කලී නියමිත දිනට අධ්‍යාපන විද්‍යාපීඨයක ස්ථිර කථිකාචාර්ය හෝ සහකාර කථිකාචාර්ය තනතුරු දරමින් සිටි පහත දැක්වෙන සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා තෘප්තකර තිබේ නම්, මෙම ඡේදය යටතේ සේවයට අන්තර්ග්‍රහණය කිරීම පිණිස සුදුසුකම් ලබා ඇති ...වට සැළකිය යුතුය.

(අ) අදාළ විෂයය ක්‍ෂෙත්‍රයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ,

(ආ) අදාළ විෂයය ක්‍ෂෙත්‍රයේ පුහුණු ගුරු සහතිකයක් ; හෝ

(ඇ) අදාළ විෂය ක්‍ෂෙත්‍රය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයාට පිළිගත හැකි වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකි ලබාගත් ඩිප්ලෝමා සහතිකයක් හා ;

(ඈ) කථිකාචාර්යවරයෙකු / සහාය කථිකාචාර්යවරයෙකු වශයෙන් වසර 9 කට නොඅඩු පළපුරුද්ද.

(II) වන ව්‍යාතිරේකය :- 2 වන පංතියේ II ශ්‍රේණියට හෝ 3 වන පංතියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරි සම්බන්ධයෙන් කාර්යක්‍ෂමතා කඩඉම් බලපාන වැටුප් තලයට ළඟාවී නොමැත්තේ නම් කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්වී සඳහා සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ දින සිට අවුරුදු 5 ක කාලයක් දෙනු ලැබේ. යම් නිලධාරියෙකු විසින් වැටුප් ක්‍රමය කාර්යක්‍ෂමතා කඩඉම් බලපාන වැටුප් තලය පසු කරනු ලැබ ඇත්තේ නම්, ඔහුට එම වැටුප් ක්‍රමයේ උපරිමය දක්වා යාමට ඉ හරිනු ලැබේ.

කෙසේ වුවද 2 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ සම්පූර්ණ කරන තෙක් ඊළඟ ඉහළ පංතියට උසස් වීම සඳහා සු සුදුසුකම් නොලබයි.

19. සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප් පරිවර්තනය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදය 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ සිදුකරනු ලැබේ.

20. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 18 වන ඡේදය අනුව සේවයට අන්තර්ග්‍රහණය කරන ලද අධ්‍යාපන විද්‍යාපීඨයක අධ්‍යය කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට අධ්‍යාපන විද්‍යාපීඨයට පත්වීමට පෙරාතුව අදාළ පරිදි කලින් සේවය කළ ශ්‍රී ලංකා ගුරු සේවය හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට ආපසු පත්ව යාමට හෝ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ සේවයෙ විශ්‍රාම ගැනීමේ, අනුග්‍රහය ලබාදීමට තරම් අදාළ නිලධාරියාට අහිතකර බලපෑමක් සිදුවී ඇති බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක එසේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමට හෝ මනාපය පළකළ හැක. මෙසේ මනාපය පළකිරීම අන්තර්ග්‍රහනය කිරීමේ ලිපියේ දිනයේ සිට වසරක් ඇතුළත සිදු කළ යුතුයි.

21. වෘත්තීය සංවර්ධනය :

(i) 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ සෑම නිලධාරියෙකුටම අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලයට පිළිගත හැකි අදාළ විෂය කේෂ්ත්‍රයට සම්බන්ධ ව්‍යාපෘතියක් යම් පාසලක හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී කරගෙන යාමට කළින් කළට නියම කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය, අදාළ වැඩ සටහන්වල අවශ්‍යතාවය හා අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලයේ නිර්දේශය මත ගුරු අධ්‍යාපනඥයින්ට වෘත්තීය වශයෙන් සුදුසුකම් ලබා ගැනීමට හැකිවනු වස් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි ශිෂ්‍යත්ව, අනුයුක්ත කිරීම් හා අධ්‍යාපන චාරිකා ආදිය සේවයේ නිලධාරීන් සඳහා ප්‍රදානය කිරීම කළ හැකිය. තෝරා ගැනීමේ පරිපාටිය හා තෝරා ගැනීම සඳහා අතිකූත් අවශ්‍යතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ඇත. අධ්‍යාපන පාඨමාලාව, අධ්‍යාපන චාරිකාව හෝ අනුයුක්ත කිරීම අවසන් කිරීමෙන් පසුව ගුරු අධ්‍යාපනඥයින්ට තවදුරටත් ගුරු අධ්‍යාපනඥයින් ලෙස සේවය කිරීමට නියම වනු ඇත.

(iii) තම තමන්ගේ සුදුසුකම් වැඩි දියුණු කර ගැනීම සඳහා ගුරු අධ්‍යාපනඥයින්ට පූර්ණ වැටුප් සහිත නිවාඩු කාලසීමා ලබා දීම සඳහා විධිවිධාන සලසනු ඇත. මෙම කාරණය සඳහා නිලධාරීන් මුදාහැරීම සේවයේ අවශ්‍යතාවයට යටත්ව විය යුතුය.

(iv) නිසිපතා සියළු නිලධාරීන් සඳහා කාර්ය සාධක ඇගයීම් ක්‍රමයක් පවත්වාගෙන යා යුතුය. එවායේ වාර්තා පවත්වා යාමටත්, උසස්වීම් සඳහා සලකා බැලීමේදී, සේවා ඇගයීම සඳහා, එවැනි වාර්තා උපයෝගී කර ගැනීමත් කළ

22. කාර්යක්‍ෂමතා කඩඉම් සඳහා විභාග පරිපාටිය මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ (ඇ) උපලේඛනයේ දක්වේ. කාර්ය කඩඉම් විභාග සඳහා අයදුම් කිරීමේ ක්‍රමය සහ අතිකූත් විස්තර කම්ටුව විසින් නිවේදනය කරනු ලැබේ.

23. මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙන් විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය ( තීරණය කරනු ඇත.

ලේකම්,
අධ්‍යාපන සේවා ;

1999 මාර්තු මස 5 වැනි දින,

"අ" උපලේඛනය

තනතුරු පිළිබඳ උපලේඛනය

| | | |
|---|---|---|
| 1 පංතිය | – | අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්<br>ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්<br>ගුරු අධ්‍යාපන ආයතන ප්‍රධානීන් |
| 2 පන්තිය – I වැනි ශ්‍රේණිය | – | අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපතිවරුන්<br>ගුරු විද්‍යාල නියෝජ්‍ය විදුහල්පතිවරුන් |
| 2 පන්තිය – II වැනි ශ්‍රේණිය | – | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (සම්බන්ධීකරණ)<br>ගුරු මධ්‍යස්ථාන ප්‍රධානීන් |
| 3 වැනි පංතිය | – | කථිකාචාර්යවරුන් |

"ආ" උපලේඛනය

විෂය ක්‍ෂෙත්‍ර ලේඛනය – විෂයයන්
(අවශ්‍ය පරිදි වරින් වර සංශෝධනය කළ හැකිය.)

සාමාන්‍ය විෂය ක්‍ෂෙත්‍රය – අනිවාර්ය

| | | |
|---|---|---|
| පළමු බස | – | සිංහල<br>දෙමළ |
| දෙවන බස I | – | ඉංග්‍රීසි |
| දෙවන බස II | – | සිංහල<br>දෙමළ |

ශ්‍රී ලංකා සමාජය–

ජාතික හා පළාත් සංස්කෘතිය
සෞඛ්‍ය හා පුද්ගල ස්වස්ථතාව

| | | |
|---|---|---|
| සෞන්දර්ය | – | චිත්‍ර<br>සංගීතය<br>නැටුම් |

පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය
ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා

වෘත්තීය විෂය ක්‍ෂෙත්‍රය – අනිවාර්ය

අධ්‍යාපන මූලධර්ම
පාසල් සංවිධානය හා පංතිකාමර කළමනාකරණය
අධ්‍යාපනික මාර්ගෝපදේශකත්වය
අධ්‍යාපනික මනෝ විද්‍යාව
අධ්‍යාපනික සමාජ විද්‍යාව
ඉගැන්වීමේ ක්‍රම
ඇගයීම හා මිනුම්

විශේෂිත විෂය ක්ෂෙත්‍රය

- විද්‍යාව
- ගණිතය
- සෞඛ්‍ය අධ්‍යාපනය
- පරිගණක අධ්‍යාපනය
- සමාජ අධ්‍යයනය
- ආගම
- ගෘහ විද්‍යාව
- ශාරීරික අධ්‍යාපනය
- තාක්ෂණික අධ්‍යයනය
- ජීවන කුසලතා
- කෘෂිකර්මය

ප්‍රාථමික අධ්‍යාපනය

- මව්බස
- සෞන්දර්ය අධ්‍යාපනය
- ශාරීරික අධ්‍යාපනය
- විශේෂ අධ්‍යාපනය
- නිර්මාණ කුසලතා
- ප්‍රාථමික ගණිතය
- ප්‍රාථමික විද්‍යාව
- ඉංග්‍රීසි

## "ඇ" උපලේඛනය

### කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස්වීම් සඳහා විභාග පරිපාටිය

I. (i) 3 වන පන්තිය සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වර්ෂයකට රුපියල් 116,400ට පෙර අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශයක් මත කමිටුව විසින් පිළිගනු ලබන ගුරු අධ්‍යාපනය හෝ අධ්‍යාපන කළමනාකරණය හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයක් සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(ii) 3 වැනි පන්තිය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වසරකට රුපියල් 124,500ට පෙර) මේ සඳහා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන අධ්‍යාපනය හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සංලක්ෂය :– 12 වැනි වගන්තියේ (II) හා (III) ව්‍යතිරේකයන් යටතේ බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වනුයේ අදාළ ක්ෂෙත්‍රයෙහි වෘත්තිකයන්/විශේෂඥයින්ගෙන් සමන්විත අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලද, මණ්ඩලයක් විසින් නිලධාරියා පිළිබඳව කරනු ලබන කාර්ය සාධන ඇගයීමකි.

II. සේවයේ 2 වැනි පන්තියේ II වන ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාර්ෂිකව රු. 166,140ට පෙර) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

(අ) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු – ලකුණු 100 – පැය 1 1/2

රජයේ ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VII, VIII, IX, XII, XIII, XIV, XXIV, XXVIII, XXX හා XXXI යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති.

(ආ) මුදල් රෙගුලාසි – ලකුණු 100 – පැය 1 1/2

රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වැනි කොටසේ I, II, V, VIII, XII හා XIV පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව.

(ඇ) අධ්‍යාපන නීතිය – ලකුණු 100 – පැය 2

අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ.

(i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි.

(ii) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත.

(iii) 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත.

(iv) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත.

(v) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත.

(vi) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනත.

(vii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත.

(viii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත.

(ix) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත.

(x) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

(xi) අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති.

සැ. යු.– අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40%ක ලකුණු ලබා ගත යුතුය.

03–611

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.